# මිනිස් සතා හා තිරිසන් සතා

බෞද්ධයන්ගේ සත්වයා යනු බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ජීවත්වන්නවුන්ගේ ඇනිමල් නොවන බව පැහැදිලි විය යුතු ය. බෞද්ධයන්ගේ සත්වයෝ සසර සැරිසරති. බෞද්ධයන්ට අනුව මිනිස්සු වෙනත් භවයන්හි සත්වයන් ලෙස ඉපදෙති. බෞද්ධයන්ට මිනිස්සු ද සත්වයෝ වෙති. සියලු සත්වයෝ නිදුක්වෙත්වා යනුවෙන් ප්‍රාර්ථනා කරන විට ඒ සත්වයන් යන්නට මිනිස්සුද අයත් වෙති. එහෙත් සාමාන්‍යයෙන් බටහිරයන්ට ඇනිමල් හා මෑන් අතර එවැනි සම්බන්ධයක් නැත. ඇතැම් බටහිර විද්වතුන් මිනිසුන් ද සත්වයන් (ඇනිමල්) ලෙස සලකන බව සැබෑ ය. එහෙත් සාමාන්‍ය බටහිරයෙක් එසේ නො සිතයි.

බෞද්ධයන්ට තිරිසන් සතා යනුවෙන් ව්‍යවහාරයක් වෙයි. තිරිසන් සතුන් යන්නෙන් සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ බටහිරයන් ඇනිමල්ස් යනුවෙන් හඳුන්වන ප්‍රාණීන් ය. බෞද්ධයන්ට තමන් පෙර අත්භවවල හෝ මතු අත්භවවල හෝ තිරිසන් සතුන් ලෙස දිවි ගෙවීම අරුමයක් නො වේ. අප මහා බෝසතාණන් වහන්සේ ද තිරිසන් සතකු ලෙස ඉපදුණු අවස්ථා ගැන බෞද්ධයන් ජාතක පෙතින් මෙන් ම වැඩිහිටියන්ගෙන් ද දැනගන්නා කරුණකි. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සසරක් නොමැති බැවින් ඒ සංස්කෘතියෙහි ජීවත්වන්නෝ ඔවුන්ට සාපේක්ෂව තිරිසන් සතුන් ලෙස නූපදති.

බෞද්ධයෝ තිරිසන් සතුන් අපා, දෙපා, සිවුපා, බහුපා ආදී වශයෙන් වර්ග කරති. බටහිරයෝ තිරිසන් සතුන් වෙනත් ආකාරවලට වර්ග කරති. මත්ස්‍යයෝ ද බෞද්ධයන්ට අනුව අපා හෙවත් පාද නැති සත්තු වෙති. තුන්පා සතුන් ලොවේ නැතැයි සිතමි. තුන්පා සතුන් නැත්තේ එවැනි සතුන්ට චලනය (ගමන් කිරීම) නොහැකි බැවින් දැයි නො දනිමි. බහුපා සත්ව ගණයට කැරපොත්තෝ, පත්තෑයෝ ආදීහු අයත් වෙති. විවිධ වූ ආකාරවල උරගයෝ සාමාන්‍යයෙන් අපා ගණයට අයත් වෙති.

බෞද්ධයන්ගේ සත්තු මිනිස්සු හා තිරිසන් සත්තු පමණක් නො වෙති. බෞද්ධයන්ට අමනුෂ්‍යයෝ ද දෙවිවරු ද බ්‍රහ්මලෝකවල උත්පත්තිය ලැබුවෝ ද වෙති. ඒ සියල්ලෝම බෞද්ධයනන්ට සත්වයෝ වෙති. අමනුෂ්‍යයෝ විවිධාකාරයෙන් වර්ග කෙරෙති. ප්‍රේත, පිශාච, කුම්භාණ්ඩ, භූත, යක්ෂ ආදී වශයෙන් අමනුෂ්‍යයෝ වෙති. දෙවියෝ ද එක් ආකාරයකට භූමාටු, වෘක්ෂ, දිව්‍ය ලෝකවල වෙසෙන ආදී වශයෙන් ද තවත් ආකාරයකින් සම්‍යක්දෘෂ්ටික හා මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු වශයෙන් ද වර්ග කෙරෙති.

ඇතැමුන්ට අනුව මිථ්‍යාදෘෂ්ටික දෙවියන් නැත. එහෙත් මට තේරෙන අයුරින් නම් (වසවර්ති) මාර දිව්‍ය පුත්‍රයා මිථ්‍යාදෘෂ්ටික දෙවියෙකි. පරනිර්මිත වසවර්තියේ පමණක් නොව වෙනත් දිව්‍ය ලෝකවල ද මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු වෙති. ඔවුහු විවිධ මතධාරීහු වෙති. විවිධ ආගමිකයෝ වෙති. නිවන් සුව ලැබීම ගැන දන්නෝ, ඒ සඳහා ඉඳහිටවත් කටයුතු කරන්නෝ සම්‍යක්දෘෂ්ටික දෙවිවරු වෙති. මිථ්‍යාදෘෂ්ටික දෙවිවරුන්ට නිවනක් ගැන විශ්වාසයක් නැත.

දෙවියකු ලෙස ඉපදීමට පෙර බවයෙහි බෞද්ධයකු ම විය යුතු යැයි නො සිතිය යුතු ය. ආනන්ද මෛත්‍රිය හිමිපාණන් වහන්සේ දේශනා කර ඇති ආකාරයට මිනිසුන් ලෙස බෞද්ධ නොවන ආගම් අදහන අය මරණීන් මතු දිව්‍ය ආත්මභාවයක් (පුනබ්භවයක්) ලබන්නේ නම් ඒ දේවතාවුන්ට ද ඇත්තේ මිනිස්භවයේ ඇදහූ ආගම ය. පුනබ්භවය සිදුවන්නේ චුති චිත්තය හා උත්පාද චිත්තය අනුව මිස ඒ ඒ සත්වයාගේ ආගම අනුව නො වේ.

විවිධ දෙවියන් හා අමනුෂ්‍යයන් මිනිසුන් සමග සන්නිදේවනය කරන බවත් එවැනි මනුෂ්‍යයන් මගින් අපට ඒ දෙවියන් හා අමනුෂ්‍යයන් ගේ ආධාර ලැබෙන බවත් කිව හැකි ය. එමෙන් ම එහි අනෙක් පැත්ත ද සිදු වෙයි. ඇතැම් විට ඔවුහු මනුෂ්‍යයන්ට විපත්ති හා අලාභ හානි ද කරති. එසේ කරන්නෝ අමනුෂ්‍යයෝ පමණක් නො වෙති. බෝසතාණන් වහන්සේට අපමණ කරදර කළ මාර දිව්‍ය පුත්‍රයා එවැනි දෙවියෙකි. ඔහු තවමත් පරනිර්මිත වසවර්ති දිව්‍ය ලෝකයෙහි වාසය කරමින් මෛත්‍රී බෝසතාණන් වහන්සේට විවිධ බාධක පැමිණවීමට උත්සාහ කරන්නේ යැයි සිතිය හැකි ය.

© Prof. Nalin De Silva

පැරණි ග්‍රීක කතාවල හා වෛදික කතාවල මිනිසුන් සමග සම්බන්ධකම් පැවැත්වූ දෙවිවරුන් ගැන සඳහන් වෙයි. ඒ හුදෙක් මිථ්‍යා කථා යැයි ඉවත දැමිය නො හැකි ය. කෘෂ්ණ දෙවියන් අර්ජුන සමග පැවැත්වූ සංවාද පිළිබඳ මහාභාරතයේත් ග්‍රීකයන් ඇපලෝ දෙවියන් සමග කරන ලද ගණුදෙනු පිළිබඳ ව හෝමර් කවියාගේ කෘතිවලත් සඳගන් වෙයි. මේ දෙවියන් එක් අයකුවත් සම්‍යක්දෘෂ්ටික දෙවියකු යැයි කිව නො හැකි ය. එහෙත් අවශ්‍ය නම් යම් අයකුට එවැනි දෙවියන්ගේ පැවැත්ම ගැන ම ප්‍රශ්න කළ හැකි ය. කිසිම දෙවි කෙනකු ගැන විශ්වාසයක් නැති අයකුගේ එවැනි ප්‍රශ්නකිරීමක සංගත බවක් දැකිය හැකි නමුදු සම්‍යක්දෘෂ්ටික දෙවිවරුන් ගැන පමණක් විශ්වාස කරන්නන් මිථ්‍යාදෘෂ්ටික දෙවියන්ගේ පැවැත්ම ගැන අවිශ්වාස කරන්නේ කිනම් පදනමකින් ද යන්න ප්‍රශ්නයක් වෙයි.

දෙවියන් අතර පමණක් නොව බ්‍රහ්ම ලෝකවල සිටින බ්‍රහ්මයන් අතර ද මිථ්‍යාදෘෂ්ටික බ්‍රහ්මයන් සිටිය හැකි ය. මෙහි දී මිථ්‍යදෘෂ්ටික යන්නෙන් අදහස් වන්නේ නිවන් දැකීමක් ගැන විශ්වාසයක් නොමැති යන්න ය. දෙවියකු මනුෂ්‍යයකුට වඩා උසස් නිසා මිථ්‍යාදෘෂ්ටික දෙවියන් සිටිය නොහැකි ය යන්න පදනම් විරහිත ය. ධ්‍යාන උපදවා ගත් මිනිස්සු සිටිති. එවැනි මිනිසුන් අනිවාර්යයෙන් ම නිවන් අවබෝධය පිණිස ධ්‍යාන උපදවා ගෙන ඇතැයි නො සිතිය යුතු ය. එහෙත් මේ මිනිස්සු මනස සම්බන්ධයෙන් ගත්කල බොහෝ දෙවියන්ට වඩා උසස් වෙති. එහෙත් ඔවුන් පසුව තම ධ්‍යාන බිඳගැනීමට ද ඉඩ ඇත. එවැනි මිනිසුන් සම්‍යක්දෘෂ්ටික වීම අනිවාර්ය නැත. උද්දාළ බ්‍රාහ්මණයා ගැන පුවත මේ සඳහා නිදසුනකි.

මිථ්‍යාදෘෂ්ටික බ්‍රහ්මයන් බඹලොවින් චුත වී අමනුෂ්‍යයන් ලෙස ඉපදීමේ ඉඩක් නැතුවා නො වේ. නෙවසඤ්ඤා නා සඤ්ඤා බ්‍රහ්මලෝකයෙහි උපත ලැබුවත් මිථ්‍යාදෘෂ්ටික බ්‍රහ්මයකුට නිවන් අවබෝධ නො වේ. මෙවැනි බ්‍රහ්මයන් බ්‍රහ්ම ලෝකයෙන් චුත ව මනුෂ්‍ය ලෝකයෙහි උපත ලැබීම පිළිබඳ කතා බෞද්ධ සාහිත්‍යයෙහි වෙයි. ඕනෑම අවස්ථාවක දෙවියන්ට හා බ්‍රහ්මයන්ට වඩා උසස් මිනිසුන් මිනිස් ලොව සිටිය හැකි ය. එහෙත් ඊළඟ මොහොතෙහි ඔවුනට කුමක් සිදුවේ දැයි අපට කිව නො හැකි ය.

ආළාර කාළාම, උද්දකාරාම පුත්ත වැනි තවුසෝ සම්‍යක්දෘෂ්ටික නො වූහ. එහෙත් ඔවුහු ධ්‍යානලාභීහු වූහ. සම්‍යක්දෘෂ්ටික දෙවියන් අතරත් සෝවාන් ආදී මාර්ගඵලවලට පැමිණි අය කෙතෙක් වෙත් ද? මෙයින් මා කීමට අදහස් කරන්නේ දෙවියෝ සෑම විට ම මිනිසුන්ට වඩා උසස් වෙති යන්න පදනම් විරහිත බව ය. අනෙක් අතට බුදුන් වහන්සේ ද මනුෂ්‍යයෙක් වූ සේක. උන්වහන්සේට වඩා ශ්‍රේෂ්ඨ දෙවියෙක් හෝ බඹෙක් හෝ නො වී ය. දෙවියන්ට මිනිසුන්ට වඩා සැප වැඩි ය. එහෙත් ඔවුන්ගේ කුසල් අවසන් වූ පසු ඔවුන් අමනුෂ්‍යයන් ලෙස වුව ද ඉපදීමට හැකි ය. (මේ ලිපියෙහි දී පුනරුත්පත්තියක් නැත, එහෙත් පුනබ්භවයක් ඇත යනුවෙන් පවසන පඬියන්ගේ කියුම් නොසලකා හැර ඇත.) සැප වැඩි වූ පමණින් දෙවියන් මිනිසුන්ට වඩා උසස් ය, ශ්‍රේෂ්ඨ ය, ආදී නිගමනවලට එළඹිය නො හැකි ය.

දෙවියකු ලෙස උපත ලබන ඕනෑම අයකු ඕනෑම මිනිසකුට වඩා උසස් වන්නේවත් ඕනෑම දෙවියකු තබා ඕනෑම බඹකුවත් සම්‍යක්දෘෂ්ටික වන්නේවත් නො වේ. හින්දු භක්තික බ්‍රහ්මයන් සිටිය හැකි ය. එපමණක් නොව ක්‍රිස්තු භක්තික දෙවියන් ද සිටිය හැකි ය. මේ ඇතැම් මිථ්‍යාදෘෂ්ටික දෙවියන් දිව්‍ය ලෝකයෙන් චුත ව මනුෂ්‍ය ලෝකයෙහි ඉප දී බුදුදහමට හා බෞද්ධ සංස්කෘතියට එරෙහිව කටයුතු කරන අවස්ථා තිබෙන්නට ඇත. දැනුදු තිබිය හැකි ය. අප සිතනවාට වඩා දෙවියන් මිනිස් ලොව කටයුතුවලට සහභාගි වන බවක් හැඟී යයි.

මිථ්‍යාදෘෂ්ටික යන්නෙහි තේරුම වැරදි දැක්මක් සහිත යන්න මිස සිත නොදියුණු යන්න නො වේ. නිවන් අවබෝධය ගැන පැතුමක් නොමැතිව භාවනාවෙහි යෙදිය හැකි ය. යෝගී අභ්‍යාසවල යෙදෙන්නන්ට නිවන් අවබෝධය පිළිබඳ හැඟීමක් තිබිය යුතු නො වේ. එහෙත් සිත ද අවසාන වශයෙන් ගත්කල තවත් ඉන්ද්‍රියක් පමණක් වෙයි. සියළු සංකල්ප සිතෙහි නිර්මාණ වෙයි. සිත ඇතැම් සංකල්ප අනෙක් ඉන්ද්‍රිය සමග එකතු වී ද තවත් සංකල්ප අනෙක් ඉන්ද්‍රියයන්ගෙන් ස්වායත්තව ද නිර්මාණය කරයි. මේ සංකල්ප නිවැරදි නොවුවත් යම් කාලයක දී සිත එක් අරමුණක තබාගැනීමට හැකිවීම උසස් ක්‍රියාවක් ලෙස අපි සලකමු.

එසේ සිත එක් අරමුණක තබාගත හැකි වීමට නිවන පිළිගත යුතු ම නො වේ. නිවන නො පිළිගන්නෝ සිතෙහි ශක්තිය (චිත්ත ශක්තිය) වැඩිකර නොයෙකුත් ලෞකික බල ලබාගනිති. ඔවුන්ගේ සිත (ශක්තියෙන්) උසස් වුවත් ශ්‍රේෂ්ඨ යැයි

© Prof. Nalin De Silva

කිවහැකි නො වේ. මාර්ගඵල අත්පත් කරගත්තෝ ශ්‍රේෂ්ඨ වෙති. මාර්ගඵල අත්කර ගැනීමේ දී ලෝභ ද්වේෂ මෝහ සිත් අත්හැරීමට සිදු වේ. භාවනාවෙන් වුව ද දැනුම ලබාගැනීමට ඇති කැමැත්ත ලෝභ සිත් උපදවයි. ඒ හේතුවෙන් ඇතැම් විට දැනුම ලබාගැනීමට ඇති අවස්ථා ද නැතිවීමට හැකි ය.

මෙහි දී අපට අවශ්‍ය වන්නේ මිථ්‍යාදෘෂ්ටික දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ සාකච්ඡාවක් නොව බෞද්ධයන් සත්වයන් වර්ගීකරණයට ලක්කරන්නේ කෙසේ දැයි පෙන්වා දීම හා බෞද්ධයන්ගේ සත්වයා බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ජීවත්වන්නන්ගේ සත්වයා (ඇනිමල්) අතර ඇති වෙනස ඉස්මතු කිරීම ය. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ සත්වයා යන්න තිරිසන් සතුන්ට සීමා වෙයි. යෙහෝවා දෙවියන් වහන්සේ නෝවාට උපදෙස් දුන්නේ තම යාත්‍රාවට සෑම සත්ව වර්ගයකින් ම ජෝඩුවක් බැගින් ලබාගන්නට ය. එපමණක් නොව පරණ තෙස්තමේන්තුවේ ද සඳහන් වන්නේ දෙවියන් වහන්සේ ඒ ඒ සත්වයා මවා පසුව තමන් වහන්සේගේ ප්‍රතිබිම්බය ලෙස මිනිසා මැවූ බව ය. දෙවියන් වහන්සේ මිනිසුන් වෙනුවෙන් සත්වයා ද ලෝකය ද මැවූහ.

බෞද්ධයන්ගේ සත්වයා යන සංකල්පයට තිරිසන් සතුන් පමණක් නොව අමනුෂ්‍යයෝ ද මිනිස්සු ද දෙවියෝ ද බ්‍රහ්මයෝ ද අයත් වෙති. එපමණක් නොව අනෙක් සත්වයන් ඇත්තේ මිනිසා වෙනුවෙන් නො වේ. මිනිස්සු අනෙක් සතුන්ට ප්‍රධාන නො වෙති. දෙවියන් ද තිරිසනුන් ද ඇතුළු අනෙක් සතුන්ට මෙන් නොව උපේක්ෂාවෙන් කරුණු තේරුම් ගැනීමේ හැකියාවක් මිනිසුන්ට ඇති බව සැබෑ ය. එහෙත් එපමණකින් මිනිස්සු සතුන්ට ප්‍රධාන නො වෙති. මිනිස් සතකු ඊළඟ අත්භවයෙහි තිරිසන් සතකු ලෙස ඉපදිය හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva